# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2170/7 - 2020 අප්‍රේල් මස 10 වැනි සිකුරාදා - 2020.04.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

නියෝග අංක 62

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

20(5) වැනි වගන්තිය යටතේ නියෝගය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 20(5) වැනි වගන්තිය යටතේ ක්‍රියා කරමින් කිසිම ආනයනකරුවකු, නිෂ්පාදකයෙකු, බෙදාහරින්නකු හෝ වෙළෙන්දෙකු විසින් පහත දක්වා ඇති සහල් වර්ග එහි සඳහන් කර ඇති උපරිම මිලට වඩා වැඩියෙන් වෙළෙඳාම් කිරීම, වෙළෙඳාම් කිරීම සඳහා ඉදිරිපත් කිරීම, වෙළෙඳාම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

| *වර්ගය* | *උපරිම සිල්ලර මිල* |
|---|---|
| කීරි සම්බා | කිලෝ ග්‍රෑම් 1 ක් රු. 125/- |
| සුදු/රතු සම්බා - වාෂ්පයෙන් තැම්බූ/තම්බන ලද (සුදුරු සම්බා හැර) | කිලෝ ග්‍රෑම් 1 ක් රු. 90/- |
| සුදු/රතු කැකුළු සම්බා | කිලෝ ග්‍රෑම් 1 ක් රු. 90/- |
| සුදු/රතු නාඩු - වාෂ්පයෙන් තැම්බූ / තම්බන ලද (මොට්ටෙයිකරුපන් සහ අට්ටික්කාරි හැර) | කිලෝ ග්‍රෑම් 1 ක් රු. 90/- |
| සුදු/රතු කැකුළු සහල් | කිලෝ ග්‍රෑම් 1 ක් රු. 85/- |

මෙම නියෝගය 2020 අප්‍රේල් මස 10 වැනි දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මගින් 2019.12.19 දින *අති විශෙෂ ගැසට් පත්‍ර* අංක 2154/19 හි පළ කරන ලද නියෝග අංක 56 මෙම නියෝගය මගින් පරිච්ඡින්න කරනු ලැබේ.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

**මේජර් ජෙනරාල් ශාන්ත දිසානායක (විශ්‍රාමික),**
සභාපති.

2020 අප්‍රේල් මස 10 වැනි දින.

1A - PG 4964 — 217 (2020/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*